සංස්කරණය/Editor
අසෝක සුබසිංහ Asoka Subasinghe

උපදේශක සංස්කාරක
ජගත් පේ එදිරිසිංහ Jagath J Edirisinghe

සංස්කරණ සහය/Asst. Editors
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක
අසෝක සිල්වා Asoka Silva

සන්නස පිරිවර

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියානි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ
Page Layout & Graphic Designs
සාමන්ත තැන්නගේ Saamantha Tennege

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

කම්කරු සමිති

අපේ රටේ කම්කරුවන් ඉතිහාසයේ පෝර පැදිදි පීඩනයකට ලක්වූ දී සිටිති. ඉහල යන ජීවන වියදමට සහිලන වැටුපක් නොලැබීම නොනවතින යුදු වියදම් ආදී බොහෝ ප්‍රශ්න නිසා ජීවන වියදම දරා ගත නොහැකි තත්වයක් උදාවී තිබේ. පීඩනය දරාගත නොහැකි බවුන් උද්ඝෝෂන හා සටන් ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වෙමින් සිටිති. මෙම අර්මුණ ඉටුකර ගැනීමට පසු වශයෙන් බෙදී සිටින කම්කරුවන් එක්සත් විය යුතුය. එහෙත් කම්කරුවන් අතර සමගිය පසු දේශපාලනය නිසා බෙදී යාමෙන් බවුන්ගේ ශක්තිය හීන වී තිබේ. බවුන් සමගි කිරීමට කිසිදු පක්ෂයක් අවංක උත්සහයක් නොගනී. දැන් ලෝක කම්කරු දිනය ආසන්නයටම පැමිණ තිබේ. ලෝක කම්කරු දිනය සැමරීම සඳහා කම්කරු සංවිධාන වලට වඩා අපේ රටේ දේශපාල පක්ෂ උනන්දුවක් දක්වයි. නමුත් සැබෑවටම එදින සිදුවන්නේ වැඩකරන ජනතාවගේ සැබෑ ප්‍රශ්න පිළිබඳව හැඩිම නැගීම වෙනුවට එකිනෙකාට අවලාද නගා ගන්නා ක්‍රියාවලියයි. අපේ රටේ වෘතීය සමිති පක්ෂ ජනතාවගේ වත්මන් තත්වය ගැන සැබෑ උනන්දුවකින් ක්‍රියා කරනවා පෙනේද? මැයි දින පෙළපාලි හා රැස්වීම් වල පවා මූලික දේශපාලනයට හිමිවී කම්කරුවා දෙවෙනි තැනට නොවැටේද? හේතුව නම් අපේ රටේ වෘතීය සමිති දේශපාලන පක්ෂවල ශාඛා සමිති බවට පත්ව ඇති නිසාය. කම්කරුවන්ගේ සැබෑ ප්‍රශ්න ගැන අවබෝධයන් දේශපාලකයාට නැත. බවුන්ට ඇත්තේ වන්දිය හා ඔලය ගැන හැඟීම පමණි. දේශපාලනයෙන් තොරව වෘතීය සමිති වලට පැවැත්මක් නැති බව සැබෑ වුවද උත්සහ කල යුත්තේ සමිති ක්‍රියා කාර්යවයට දේශපාලකයන්ගේ ඔලපෑම අඩුකිරීමටය. වෘතිය ප්‍රශ්න සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට ආන්ඩුවට ඔලපෑමක් කිරීමට නම් කම්කරු පංතිය වත් වෘතිය සමිති සම්මේලනයක් ගොනු විය යුතුය. අපේ රටේ දේශපාලකයන් වැඩ කරන ජනතාව කෙරෙහි සැබෑ උනන්දුවක් දක්වන්නේ නම් වෘතිය සමිති එකසත් කිරීමේ වැඩපිළිවෙලට එකඟ විය යුතුය. වෘතිය සමිති තම තමන්ගේ පක්ෂ වල ශාඛා සමිති ලෙස පවත්වාගෙන යාමට වඩා එය වැදගත් කොට සැලකිය යුතුය. මන්ද රටක ආන්ඩුවක් හිඹිය යුත්තේ හුදෙක් මිනිසුන් ජීවත් කරවීමට පමනක් නොව බවුනට වඩා හොඳ ජීවිතයක් ලබා දීමට නිසාය.

සැමදා ජවිපෙ පුපුරා ගියේ එකම හේතුවකටයි - ධර්මසේකරගේ සිට වීරවංශ දක්වා

ජනතා විමුක්ති පෙරමුණ 'ද්‍රෝහියා' කියා පළමුවෙන්ම එළවා දැමූ ධර්මසේකර ප්‍රමුඛ කණ්ඩායමේ සිට විමල් වීරවංශ 'කුමන්ත්‍රණකරුවා' කියා එළවා දැමීම දක්වා එළවා දැමූ හෝ ඉවත්ව ගිය පිරිස බොහෝය. එම පිරිස ජවිපෙ වත්මන් සාමාජිකත්වය මෙන් දෙගුණයක් විය හැක....., එජාපයෙන් හෝ ශ්‍රීලනිපයෙන් හෝ ඉවත්ව යන සාමාජිකයෙකු නැවත එම පක්ෂවලට පැමිණෙනු අපි දැක ඇති නමුත් ජවිපෙන් ඉවත් වුවහොත් ඉවත් වුණාම ය. නැවත ආ නොහැකි වා පමණක් නොව, නැවත ඔවුන්ව ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ද ජවිපෙ සතුව නැත. ගිය එකා පට්ට 'ද්‍රෝහියෙකු' ලෙස ලේබල් ගසා හැකි නම් මරා දමනු නිසැකය. ඔවුන් පක්ෂය තුළ සිටිද්දී කළ පරිත්‍යාග කිසිවක් එදාට වලංගු නොවේ.....

- විමල් ධීරසේකර විසිනි -

"මං හරියටම කියන්නම්! කවදාහරි විමල් වීරවංශ ඔය ජේවීපී එකෙන් අයින් වෙනවා.!"
"අයින් වෙලා?"
"අයින් වෙලා වෙනම පක්ෂයකුත් හදනවා, හැබැයි ඊට කළින් පත්තරේකුත් ගහනවා"
"ඇයි විමල් අයින්වෙන්නේ?"
"මිනිහට ජේවීපී එක පොඩි වැඩියි"

ඉහත දැක්වූයේ මීට වසර 3 කට පමණ පෙර සන්ධානය සෑදූ අලුත මාගේ මිතුරකු මධු පානයේ යෙදෙන අතරවාරයේ මා සමග කී කතාවකි. ප්‍රශ්න ඇසුවේ මාය. ඔහුගේ මතයට එදා සම්පූර්ණයෙන්ම එකඟ නොවුනද විමල් වීරවංශ යනු පක්ෂයේ අනෙක් නායකයන්ට වඩා පුද්ගල හැකියාවන් තිබෙන අයෙක් බව පිළිගත්තෙමි. පුද්ගල හැකියාවන් වැඩියෙන් තිබෙන අයට ජනතා විමුක්ති පෙරමුණ එම හැකියාවන් වැඩි දියුණු කරගත හැකි පක්ෂයක් නොවේ. නමුත් ඔවුන් කියන්නේ එහි අනෙක් පැත්තය.

අද විමල් වීරවංශ සංවේදී කථාවකුත් පවත්වා පක්ෂයෙන් ඉවත්වී ඇත්තේ නිකම්ම නොවේ. පාර්ලිමේන්තුවේ තවත් 11 දෙනකු ද සමගිනි.
ජනතා විමුක්ති පෙරමුණ 'ද්‍රෝහියා' කියා පළමුවෙන්ම එළවා දැමූ ධර්මසේකර ප්‍රමුඛ කණ්ඩායමේ සිට විමල් වීරවංශ 'කුමන්ත්‍රණකරුවා' කියා එළවා දැමීම දක්වා එළවා දැමූ හෝ ඉවත්ව ගිය පිරිස බොහෝය. එම පිරිස ජවිපෙ වත්මන් සාමාජිකත්වය මෙන් දෙගුණයක් විය හැක. ඔවුන් අතර පක්ෂයෙන් ඉවත්වූ පසු දේශපාලනය නොකොට තම විවිධ පුද්ගල හැකියාවන් දියුණු කර ගනිමින් මේ සමාජයේ ඉහළින් වැජඹෙන පිරිස ද බොහෝය. සුසිල් සිරිවර්ධන, ලයනල් බෝපගේ, ආචාර්ය ජයදේව උයන්ගොඩ, මහාචාර්ය ගාමිණී කීරවැල්ල, මාගා නම් සුප්‍රසිද්ධ කොන්ත්‍රාත් සමාග මේ අයිතිකරුවන් වන කැප්ටන් කුලරත්න සහ මදරසිංහ, චිත්‍ර හා මූර්ති ශිල්පී නයනානන්ද විජේතිලක, වික්ටර් අයිවන්, සුනන්ද දේශප්‍රිය, රෙජිනෝල්ඩ් කුරේ වැන්නන් ඉන් අතලොස්සකි. එජාපයෙන් හෝ ශ්‍රීලනිපයෙන් හෝ ඉවත්ව යන සාමාජිකයෙකු නැවත එම පක්ෂවලට පැමිණෙනු අපි දැක ඇති නමුත් ජවිපෙන් ඉවත් වුවහොත් ඉවත් වුණාම ය. නැවත ආ නොහැකි වා පමණක් නොව, නැවත ඔවුන්ව ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ද ජවිපෙ සතුව නැත. ගිය එකා පට්ට 'ද්‍රෝහියෙකු' ලෙස ලේබල් ගසා හැකි නම් මරා දමනු නිසැකය. ඔවුන් පක්ෂය තුළ සිටිද්දී කළ පරිත්‍යාග කිසිවක් එදාට වලංගු නොවේ. මේ සම්බන්ධ උදාහරණ ගණනාවක් ඇතත් ඉන් සංවේදී එකකක් පමණක් සඳහන් කරමි.

විජේවීර 71 දී අත්අඩංගුවට පත්වූ පසු යාපනය බන්ධනාගාරයේ රඳවා සිටිද්දී ඔහු මුදා ගැනීම සඳහා 20 කින් යුත් කණ්ඩායමක් රැගෙන යාපනය බලා ගිය නන්දන මාරසිංහ මහතා පසු කලෙක 'ද්‍රෝහියෙකු' ලෙස එළවා දැමීය. ජවිපෙ දෙවන සන්නද්ධ විමෙන් පසු මාරසිංහව මරා දමන්නේ අනුරාධපුර පොලේ සෙරෙප්පු විකුණමින් සිටියදී ය.

24 වන පිටුවට